# ★ ඉලක්ක ★

1968 ජනවාරි මස 12 වෙනිදා මල්තොට ගමට වැදගත් දිනයක් විය. 1969 කුඹුරු ගොවිතැන් වැඩ ඉලක්ක සම්පාදනය කිරීම උදෙසා ගමේ ගොවිකාරක සභාව ගමේ පාසැලේ එදින සවස 3ට රැස්වීමට නියමිතව තිබිණි. ගොවිකාරක සභා රැස්වීමක් පවත්වන බවට පළාතේ කඩ මණ්ඩියේද, තැපැල් පලේද සමුපකාර සමිතියේද දැන්වීම් අලවා තිබුණි. ඒ ඇරත් ගම පුරාම අණබෙරයක්ද යවන ලදී. සවස තුන වන විට ගොවියන්ගෙන් හා රජයේ නිලධාරීන්ගෙන් පාසැල පිරී ගියේය. ගොවි පවුල් 250න් ගෘහමූලික ගොවියෝ 150 දෙනෙක් පැමිණ සිටියෝය. ගොවිජන දිස්ත්‍රික්ක කොමසාරිස්, මල්තොට පත්තුවේ ගොවිජන ප්‍රාදේශීය නිලධාරි, පළාතේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි ගො. ජ. සේ. ඕවර්සියර් මහතුන්, කෘෂිකර්ම ව්‍යාප්ති සේවක මහතුන්, පළාතේ ආදායම් පාලක නිලධාරි, ගම් වගා නිලධාරි, ආදී ප්‍රභූ මහතුන් රැසක්ද පැමිණ සිටියහ. පන්සිල් ගැනීමෙන් පසු සභාවේ වැඩ ඇරඹිනි.

**සභාපති.**—පළමුවෙන්ම මම දිස්ත්‍රික්ක ගො. ජ. කොමසාරිස් තුමා, හා පළාතේ ආදායම් පාලක නිලධාරි තුමා ඇතුළු රජයේ අනික් නිලධාරි මහත්වරු පිළිගන්නවා. ඒ වගේම අපේ ඇරයුම පිළිගෙන මෙපමණ ගොවි මහත්වරු සංඛ්‍යාවක් පැමිණීම ගැනත් මම ප්‍රීතිවෙනවා. දැන් සභාවේ වැඩ ගෙනයෑමට දිස්ත්‍රික්ක කොමසාරිස් තුමාට මූලසුන ගන්නා ලෙස මම ආරාධනය කරනවා. (සභාවෙන් අත්පොළසන්)

**දි. කොමසාරිස්.**—අද වැඩ සටහන අනුව අපට ඇත්තේ ඉදිරි වසරට කුඹුරු වැඩ සඳහා ඉලක්ක සාදා ගැනීමයි. කවුරුත් දන්නවා ඉලක්ක කියන්නේ ක්‍රමානුකූල ගොවි නිෂ්පාදනය සඳහා අප පසුකර යා යුතු දිනුම් කණුයි. මුළු ගමනක දුර හැතැප්ම 5ක් නම් මෙච්චර විනාඩි ගණනකින් පළමුවන දිනුම් කණුව පසුකරන්න ඕනෙයි, තවත් මෙච්චර විනාඩි ගණනකින් දෙවෙනි දිනුම් කණුව පසුකරන්න ඕනෙයි කියල අපි දැනගත්තම හැතැප්ම/පහ යන්න යන්න අඩුම වේලාව අපට දැනගන්න පුළුවන්. ඒවගේ තමයි දැන් රජයත් රට ආහාර අතින් ස්වයංපෝෂිත කරන්න වෑයම් කරන්නේ. අවුරුදු පහක වැඩ පිළිවෙලක් තමයි තියෙන්නේ දිනුම් කනු 5 ක් තිබෙනවා.

**සිරිපාල.**—මොනවද මහත්තයෝ මේ දිනුම් කණු.

**දි. කො.**—ඇයි 1967 ඉලක්කය පසුකර යන දිනුම් කණුව, ඒවගේම 1968, 1969 1970, 1971, 1972 ආදිය.

**කෘ.උ.**—දැන් 1967 දිනුම් කණුවට අපි ළඟාවුනා. ගොවි මහත්වරු දුන් නොමසුරු සහයෝගය නිසා තමයි අපි ජයග්‍රහණය කළේ. දැන් ඉතින් 1968 දිනුම් කණුව.

**සියදාස.**—මට නම් තාම කිසිම දෙයක් තේරෙන්නේ නෑ. මේ මහත්වරු මොනව කතා කරනවාද කියලා ?.

**ආ. නි.**—ඇයි ? කොටින්ම කියනව නම් අපි අද තීරණය කරගන්න ඕන මේ ගොවි කාරක සභාවල ප්‍රදේශය තුළ කොපමණ රට පෝර හොණ්ඩර ගානක් දානවද කොපමණ පැල සිටුවනවාද ? කොපමණ කුඹුරුවල වල් පැල නෙලනවද, කොපමණ වතුර ගෙනියන ඇලවල් සුද්ධ කරනවද, කොපමණ ඇනිකට් බඳිනවද, ට්‍රැක්ටර් වලින් කොපමණ අක්කර ගාණක් හානවද, ආදී වශයෙන්.

**සයිමන්.**—සිංහල රජකාලෙත් ඔය ඉලක්ක තිබුණයි මිනිස්සු ගොවිතැන් කළේ ? (සභාවේ අය නිලධාරි පිරිස පුදුමයෙන් එකිනෙකා මුහුණ බලති).

**පාලක ලේකම්.**—සයිමන් කියන දේවල් අපි පිළිගන්නේ නෑ. ගමේ හොඳ වැඩ උනත් කොයි එකටත් විරුද්ධ වන අය එමට සිටිනවා. එනිසා කොපමණ විරුද්ධ වාදීන් සිටියත් මේ ගමේ උන්නතිය සඳහා අපි අද ගොවිතැන් ඉලක්ක හදනවා හදනවාමයි. (සභාවෙන් අත් පොලසන්).

**ගො. ජ. සේ. ප්‍රා. නි.**—දැන් මේ මුළු දිස්ත්‍රික්කයේම ගො. කා. සභා ඉලක්ක හැදුවට පස්සේ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික්ක ගොවි කමිටුව මෙම ඉලක්ක නැවත සලකා බලනවා.

**අප්පුහාමි.**—ඒ මොනවටද ?.

**දි. කො.**—ඇයි ? ජයගන්න බැරි ඉලක්ක දීල වැඩක් නැහැ. වැලි කුඹුරු අක්කර 1,000ක් තියෙන යායක අක්කර 950ක් පැල සිටුවන්න කිව්වොත්. අපි ඉස්සෙල්ල දැනගන්න ඕන පැල සිටුවන්න කම්කරුවො ඉන්නවාද ? වැලි පසේ වැඩිය හොඳ පැල සිටුවන එකද, පේලියට වී ඇට දමන එකද, ඇති තරම් රටපෝර තියෙනවද කියල ආදිය. ඉතින් බැරි ඉලක්ක තියෙනව නම් ඒවා අඩු කරනවා. අඩු ඉලක්ක තියෙනවා නම් ඒවා වැඩිකරලා ගොවියනට ජයගන්න පුළුවන් සධාරණ ඉලක්ක දෙනවා.

**ආ. පා. නි**—ඉතින් මේ ඉලක්ක සෑම දිස්ත්‍රික්ක වලින්ම එක්කාසු කරන මුළු ලංකා වටම පොදු සාධාරණ ඉලක්ක ගොවිකම් අමාත්‍යාංශයෙන් හදනවා

**සභාපති.**—මම දැක්ක අර 1968 ක්‍රියාත්මක වැඩපිළිවෙල හා ඉලක්ක කියල පොඩි පොත් පිංචක්. එහෙ නම් ඒවා ගැන වෙන්න ඇති මේ කිව්වේ.

**ආ. පා. නි.**—ඔව් ඒක තමයි බලන්න ගොවියන්ගේ අදහස් අනුව, සෑම ගොවි කාරක සභා ප්‍රදේශයකම සාකච්ඡාවෙලා ඊට පස්සේ සෑම ආදායම් පාලක කොටසකම සාකච්ඡා වෙලා, දිස්ත්‍රික්කයේත් සාකච්ඡා කරල තමයි ඔය 1968 ඉලක්ක හැදුවේ. ඉතින් 1969ටත් එහෙමම තමයි.

**සෝමදාස.**—ඉතින් ඔය ඉලක්ක අනුව අපට වැඩ කරගන්න බැරිවුනොත් මොකද වෙන්නේ.

**ගො. ජ. සේ. කො.**—නියගෙක් ගංවතුරක් ඇවිල්ල අපේ අවාසනාවට බැරිවුනොත් රට තව තවත් දුප්පත් වෙනවා. රටේ මුදල් හිඟවෙනවා, ගොවියාට පහරක් වදිනවා.

**ගො. ජ. ප්‍රා. නි.**—මම දැන් කියවන්නම් ඉලක්ක හදන්න තියෙන ඒවා.

1. වපුරන අක්කර ප්‍රමාණය.
2. අක්කරයකට අස්වැන්න
3. පුද්ගලික බිත්තර වී ගොවිපළවල්

4. ගොවි කාරක සභා ප්‍රදේශයට අවශ්‍ය සහතික කළ බිත්තර වී යලට මහට වෙන වෙනම

5. ගොවි කාරක සභාවෙන් විකුණන්න බලාපොරොත්තු බිත්තර වී ප්‍රමාණය යලට මහට වෙන වෙනම

6. වැඩි දියුණු කළ බිත්තර වී පාවිච්චිය යලට මහට වෙන වෙනම

7. අක්කර කීයක් ඒ බිත්තර වී වලින් වගාවෙනවද ?

8. මේ ගොවි කාරක සභා ප්‍රදේශය තුළ කොපමණ රසායනික පොහොර පාවිච්චි කරනවාද ? මොනවාද ඒ පොහොර වර්ග

9. කෙටි කාලීන ණය කොපමණ අවශ්‍යද ?

10. උදළු කොපමණ මේ ගොවි කාරක සභා ප්‍රදේශයට අවශ්‍යද ?

11. ගොවි කාරක සභා ප්‍රදේශයේ කෙරෙන සුළු වාරිමාර්ග වැඩ මොනවාද ? එයට යන වියදම ආදී විස්තර

12. ගොවි කාරක සභා ප්‍රදේශයෙන් කොපමණ වී ප්‍රමාණයක් මිලයට ගත හැකි වේද ?

13. ග්‍රාමීය මට්ටමේ පොහොර ගබඩාවක් අවශ්‍යවේද ? එහි විස්තර

ඔන්න ඔය වාගේ ප්‍රශ්නවලට අපි දැන් උත්තර සපයා ගන්න ඕනෑ මහත්වරුනි.

**ගො. ජ. සේ. කො.**—දැන් මේ ගො. කා. සභා ප්‍රදේශය තුළ අක්කර 1,223ක් තිබෙනවා. අපි පළමුව වපුරන අක්කර ප්‍රමාණය තීරණය කර ගනිමු.

**ලේකම්.**—ගිය අවුරුද්දේ අපි අක්කර 9,720ක් වගා කළා. මේ පාර ගල් අමුනේ ඇනිකට් එක ගොවිකාරක සභාවෙන් රු. 4,500ක් වියදම් දරල සෑදුවා. ඒනිසා මම යෝජනා කරනවා මහට අක්කර 1,020ක් හා යලට අක්කර 900 කුත් වැඩ කරන්න ඕනෑය කියල.

**සියාතු.**—මගේ කුඹුර ඇලේ කොනේ තියෙන්නේ. කවදාවත් වතුර හම්බ වෙන්නේ නෑ. මගේ කුඹුර හැමදාම පාළුයි. මම යෝජනා කරනවා හැම සුමානයකටම වතාවක් උඩ කුඹුරු කාරයින්ගේ කුඹුරුවල බට වහල ඇල කොනේ ඉන්න අපටත් වතුර ලැබෙන්න සලස්වන්න කියල.

**කිරිබණ්ඩා.**—ඔව් ඒක ඇත්ත, එහෙම නොකළොත් අක්කර 1020ක් සාර්ථක ලෙස වගා කරන්න හම්බ වෙන්නේ නෑ.

**ග. ව. නි.**—ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්නට මම පොරොත්දු වෙනවා. (සභාවෙන් අත්පොලසන්).

**කෘ. උ.**—ඊළඟට අපි අක්කරයකින් ලැබිය හැකි අස්වැන්න තීරණය කර ගන්න ඕන.

**ගිරිගෝරිස්.**—නුපන් ළමයින්ට කේන්දර හදනවා වගේනේ මහත්මයෝ ඒක.

**කෘ. උ.**—අපි ගෙයක් හදන්න ඉස්සෙල්ල ගෙට යන වියදම කොපමණද ගඩොල් කොච්චර යාද, ආදිය විමසා බලනවා. එතකොට ගේ අපි ළඟ තියෙන සල්ලි වලින් හදන්න පුළුවන්වේද නැත්නම් අපි ණයවේද ආදිය බලාගන්න පුළුවන්.

**ගො. ජ. සේ. ප්‍රා. නි.**—එහෙම තමයි මේ ලැබෙන්න තියන අස්වැන්නත් අපි ගණන් ගන්නේ. ඒ මොකටද ඒ අස්වැන්න රජයට මිලයට ගන්න කොපමණ මුදලක් වියදම්වෙයිද ? ඒ ලැබෙන වී ගබඩාකරන්න පහසුකම් තියෙනවාද ? ආදි වශයෙන් කලින් අපි එළඹිය යුතු තීරණ තියෙන නිසා.

**පුංචිබණ්ඩා.**—මැස්සෝ බීල ගියොත් සේරම ඉවරයි.

**කෘ. ව්‍යා. සේ.**—ඒක තමයි මම ගොවි මහත්වරුන්ට හැමදාම කියන්නේ මැස්සෝ දකින කොටම බෙහෙත් ගහන්න කියල. උන් මර්ධනය කරන්න.

**කෘ. උ.**—හොඳයි සංඛ්‍යා ලේඛන අනුව, පේනවා ගිය අවුරුද්දේ මේ ගොවි කාරක සභා ප්‍රදේශයේ බුසල් 50ක පමණ සාමාන්‍ය අස්වැන්නක් අරගෙන තියෙන බව.

**ගො. ජ. සේ. කො.**—එහෙනම් අපි තීරණය කරමු ලබන අවුරුද්දේ බුසල් 60ක් සාමාන්‍ය අස්වැන්නක් ගන්න පුළුවන් වෙයි කියල.

**රන්හාමි.**—බුසල් 60ක් ගන්න බැරි වුනොත් මහත්මයෝ ආණ්ඩුවෙන් අපට දඬුවම් දෙනවාද ?.

**ආ. පා. නි.**—අර ඉස්සෙල්ල මහත්මයෙක් ඇහුවා සිංහල රජ කාලෙත් ඉලක්ක තිබුණද කියල. දැන්මට ඒකට උත්තර දෙන්න පුළුවන්. සිංහල රජ කාලෙ නම් වැඩ කරන්න පුළුවන් හොඳ ගොවියෙක් හොඳ කුඹුරකින් හොඳ අස්වැන්නක් ලබා නොගත්ත නම් රාජ උදහසට ලක් වෙන්නත් තිබුණ. නමුත් දැන් තියෙන අපේ ආණ්ඩු ක්‍රමයේ හැටියට සර්ව සාධාරණ අනුකම්පාවක් සාධාරණ පොදු නීති පද්ධති යක් තියෙන නිසා දුප්පත් අහිංසක ගොවියන්ට නොමනා දඬුවම් දීමට රජය ඉදිරි පත් වන්නේ නෑ, රජය කවදත් ගොවියන්ට අත දීමට කැමතියි. (සභාවෙන් අත් පොලසන්).

**ගො. ජ. සේ. කො.**—ඊලඟට අපි තීරණය කරමු බිත්තර වී ගොවිපලවල් කීයක් මේ ගොවිකාරක සභා ප්‍රදේශයේ දානවද කියල.

**කිරිහාමි.**—මොනවටෙයි මහත්තයෝ බිත්තර වී ගොවිපලවල් දාන්නේ. අපට ඕන බිත්තර වී අපි ලඟ තියෙනවා.

**සභාපති.**—කිරිහාමිට ඕන බිත්තර වී කිරිහාමි හදාගත්තට හැමෝම ලඟ බිත්තර වී නෑ.

**කෘ. උ.**—ඊටත් වඩා මේ බිත්තර වී හැදීම ඒ තරම් ලේසි පහසු වැඩක් නොවෙයි. වෙන වී වර්ග සමඟ පරාග පෝෂණය වෙන්ටත් කලවම් වෙන්ටත් වල්පැල ඇට කලවම් නොවෙන්නත්, හොඳින් පැලවීමේ ශක්තිය ඇතිවෙන්නටත් බොහොම ප්‍රවේසමෙන් කළ යුතු වැඩක්. ඒක අපි යායක දක්ෂ ගොවියෝ ටික දෙනෙකුට සාරවත් කුඹුරුවල කිරීමට බාරදෙන්න ඕනෑ. බිත්තර වී ගොවිපලවල් දමන ගොවියන්ට අපි ක්‍රමානුකූල උපදෙස් වෙනම වරින් වර දෙනවා.

**කෘ. ව්‍යා. සේ.**—දැන් කලින් අපි තීරණය කලා අක්කරයක සාමාන්‍ය අස්වැන්න බුසල් 50ක් කියල. මුළු ගොවි කාරක සභා ප්‍රදේශයේ අක්කර 1,020ක් තියෙනවයි කිව්ව. එතකොට අක්කරයකට බුසල් 2 බැගින් අක්කර 1,020 ට වී බුසල් 2.040 ක් ඕනෑ. ඒනිසා සාමාන්‍යයෙන් අක්කර 40-50ත් අතර බිත්තර වී ගොවිපලක් අපට අවශ්‍යයි.

**ආ. පා. නි.**—ඔව් සේරම ගොවියො බිත්තර වී ගන්නේ නැනේ. අනික් අතට බිත්තර වී සේරම පරීක්ෂණ වලින් සුදුසුයයි තීරණය වන්නේත් නැනේ.

**ගො. ජ. සේ. කො.**—හොඳයි අපි තීරණය කරමු එච්-8 වර්ගයේ අක්කර 40ක බිත්තර වී ගොවිපලක් හොඳෙයි කියල.

**ගො. ජ. කො.**—ඊලඟට අපි තීරණය කරගන්න ඕන කොපමණ රසායනික පොහොර ප්‍රමාණයක් මේ ගො. කෘ. සභා ප්‍රදේශය තුල පාවිච්චි කරනවද කියල.

**සභාපති.**—ගිය අවුරුද්දේ අපි පාවිච්චි කරල තියෙනව මුළු කුඹුරු ප්‍රමාණය වූ අක්කර 1,020 න් සියයට 50 කට.

**කෘ. උ.**—එහෙමනම් අපි මේ වාරේ අක්කර 600 කට පෝර දමමු. එතකොට අක්කරයකට සාමාන්‍යයෙන් පෝර හො. 4 ½ බැගින් අක්කර 600 ... 2,400
300

පෝර හො. 2,700ක් ඇතිවේය කියල හිතන්න පුළුවන්. 2,700

**සියාතු.**—මේ වාගේ කුඹුරට පෝර දැම්මහම ගොයම ඕනාවට වැඩිය කොල ගවරය හැදෙනවනෙ ඒක නිසා පෝර දමන්න මම කැමති නෑ.

**කෘ. ව්‍යා. සේ.**—එහෙනම් ජීවාන්තක අඩංගු පොහොර අඩුවෙන් දමන්න අනික් පෝර දෙවගීය නිර්දේශ කරල තියෙන ප්‍රමාණය දමන්න.

**උක්කුබණ්ඩා.**—අපට පෝර වේලාවට හම්බවෙන්නේ නැනෙ. මඩට දාන පෝර නම් කවදාවත් හම්බවෙන්නේ නැනේ. වේලාවට.

**සමූ. සභාපති.**—අපට පෝර දිගුකල් ගබඩාකර තබන්න සමිතියේ ඉඩ නෑ.

**ගො. ජ. කො.**—ඒ ප්‍රශ්නෙ දැන් විසඳෙනව මේ අළුත් ග්‍රාමීය පෝර ගබඩාව හැදුවහම.

**ගො. ජ. ප්‍රා. නි.**—දැන් මේ ප්‍රදේශයේ ගොවීන්ට උදළු කොපමණ අවශ්‍යද කියන එක තීරණය කරගන්න ඕන.

**ලේකම්.**—මේ උදළු ඉල්ලපු ලැයිස්තුවක් මා ලඟ තිබෙනවා. උදළු 500 ක් ඉල්ලල. තියෙනවා. සේරම ගොවියෝ.

**ලොකුබණ්ඩා.**—ඔය උදැල්ලක මිල කීයද?

**කෘ. උ.**—උදැල්ලක මිල රු. 8.25 යි.

**සභාපති.**—එහෙනම් උදළු 500 ක් අවශ්‍යයයි කියා අපි අද තීරණය කරමු.

**ගො. ජ. සේ. කො.**—මේ අවුරුද්දට මේ ගොවි කාරක සභා ප්‍රදේශයේ කෙරෙන සුළු වාරිමාර්ග වැඩ මොනවාද කියල අද අපි තීරණය කර ගන්න ඕන.

**ලේකම්.**—මම ගම් වගා නිලධාරි මහත්මයාට මේ ගොවියොත් එක්ක සාකච්ඡා කරල රු. 10,000 ක වැඩ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරල තියෙනව. අළුතෙන් යාර 50 ක ඇලක් කපන්නයි ඇනිකට් 3ක් බඳින්නයි. හැබැයි රු. 20,000 ක විතර වැඩට අපි ඇස්තමේන්තු කරල තියෙන්නේ රු. 10,000. ඒ මොකෙ ද මේ ගොවියො එකඟවෙලා තියෙනවා හුඟක් පස්වැඩ නොමිලේ ශ්‍රමදාන පිළිවෙලට කරල දෙන්න. ඒ නිසා මේ ගොවි කාරක සභා ප්‍රදේශයේ ගොවියන්ට අපි බොහොම ස්තුති කරනවා (සභාවෙන් අත්පොලසන්).

**ගො. ජ. කො.**—අපිටත් මේ ගොවියන්ට ස්තුතිකරන්න හිතෙනවා. මෙපමණ උනන්දුවෙන් ගො. කා. සභාවේ වැඩ ගෙනයෑම ගැන. දැන් අනික් ඉතිරි කරුණු පිළිබඳ ඉලක්ක අපි යෝජනා කරලා හමාරයි. අදට නියමිත වැඩ හමාරයි. මෙපමණ හොඳින් ඉවසිල්ලෙන් සභාවේ වැඩ ගෙනයෑමට ඉඩදීම ගැන තමුන්නාන්සේලාට මම ස්තුති කරනවා. අද සභාවේ වැඩ අවසානයි.

**සභාපති.**—දැන් ගෙවිලියක් විසින් විරිදු ගායනාවක් කරනවා ඇති.

අනාගතයෙ සුබ සිහිනය ලක්වැසි ජනතාව දැක්ක
කවුරුත් එකමුතුව සද නිම කලෙ ගොවි වැඩ ඉලක්ක

දිනුම් කණුව ජය මාවත දිනුවා හැට හත වසරේ
මුළු සිරිලක ගොවි හඬ ගොවි යුගයක පිළිරුව් පැතිරේ

පොහොර දමා වල් පැල නෙලමින් හොඳ අස්වනු ගන්නට
ලබන වසරෙදිත් ඉලක්ක දිනමුය ජය පැන් බොන්නට

සූදනම් නිලධාරින් ඕනෑ උපදෙස් දෙන්නට
නංගී මල්ලී මඩට බැහැල එන්නකො පැල සිටු වන්නට

බාදක හිරිහැර තිබුනත් සංවර්ධන සඳහා යුගේ
පෙන්වමු ලොව අනිත් අයට මේ ලක් මුතු ඇටයෙ අගේ

ඉරිසියාව තරහ වයිර බාදක හැම දුරුවේවා
ලක් දරුවන් එක සෙවනේ හිනැහෙන දින ලං වේවා

**සභාපති.**—සභාවේ වැඩ හමාරයි සියළු දෙනාටම ස්තුතියි.

**එස්. එන්. දිසානායක විසිනි.**

## උසස් අස්වැන්නක් දෙන නව වී වර්ගයක්—අයි ආර්—8

1968 ඔක්තෝබර් මසින් ඇරඹෙන ලබන මාස් කන්නය සඳහා පිලිපීනයෙන් අයි.ආර්. 8 වර්ගයේ බිත්තර වී බුසල් 10,000ක් රජය විසින් ආනයනය කෙරෙනු ඇත. ලංකාවේ වියලි කලාපයේ විශේෂ ව්‍යාපාර හා වැඩපිලිවෙල් ක්‍රියාත්මක වන පෙදෙස් වලට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම බිත්තර වී බෙදා හරිනු ඇත. අක්කරයකට බුසල් 150 ක සාමාන්‍ය අස්වැන්නක් දීමේ බලයක් අයි.ආර්—8 වර්ගය සතුවේයයි බලාපොරොත්තුවේ.